Page 5 April 2013.qxd 15/05/2013 08:08 Page 1



# සියල්ල මෙසේ සිදුවිය!

16

## සංස්කාරක - දයා ආනන්ද රණසිංහ විසිනි

ලංකාවිත්ති පුවත්පත ආරම්භ කළ දා සිට මේ වසර දහසය මුළුල්ලේ එහි කර්තෘ / සංස්කාරක වශයෙන් හැම කලාපයක් තුළින් කළා ක් මෙන් මේ අවසාන පත්‍රයෙන්ද මම සහෘද පාඨක ඔබට සියල්ල නොසඟවා කියමි. මෙතෙක් මා අතින් නිමැවූ ඒ සියලුම කලාප අතරින් මට එළි දක්වන්නට ඉතාමත් දුෂ්කර කලාපය නම් මෙයයි. වෙනදා තිබුණු ප්‍රබෝධය මේ වැඩකරන මොහොතේ මා තුළ ඇත්තේම නැත. කියන්නට බැරි කිසියම් දුකකින් මා සිත වෙළී පවතී. ඔබත් මේ පුවත්පතත් අතර වූ අතිශය සහෘද බැඳීම මත ඔබට ද එය දැන් වැටහෙනවා ඇතැයි යන්න මගේ නිසැක විශ්වාසයයි.

### තීරණය මගේ ය

ලංකාවිත්ති පුවත්පත නවත්වන්නට මා හදිසියේ ගත් තීරණය තනිකරම මගේ තීරණයකි. එසේ සිතා පැයකට පමණ පසු මගේ ඉතා ළඟම හිතවතුන් දෙදෙනෙකුට ඒ බව මා දුරකතනයෙන් කී විට ඔව්හු එකහෙළාම එයට විරුද්ධ වූහ. එදින කීප විටක්ම මට කතා කොට එසේ නොකරන්නැයි ඉල්ලා සිටියහ. එහෙත් මා කළ කරුණු පැහැදිලිකිරීම් මත අවසන ඔව්හු කිසිවක් නොකියා නිහඬ වූහ.

මේ ලිපිය සකස් කරන මොහොතේත් මේ අවසාන කලාපය බව දන්නේ ඔවුන් පමණකි. මෙය නිකුත් වූ විට පාඨක ප්‍රතිචාරය කුමක්වේදැයි මට සිතා ගන්නට බැරිය. එහෙත් ලංකාවිත්තියට ලැදි සමස්ථ පාඨක සමූහයා වික්ෂිප්ත සංවේගයට පත්වන බව නම් නිසැක ය. ඒ ගැන සිතීම ද මට නොසැහෙන අපහසුවකි.

### මුද්‍රණාලය වසාදැමීම

ලංකාවිත්ති පත්‍රය මුද්‍රණය කළේ එසෙක්ස් (Essex) ප්‍රාන්තයේ (Dagenham) ඩැගන්හැම් ප්‍රදේශයේ **News Fax** නම් දැවැන්ත පුවත්පත් මුද්‍රණාලයේය. එහි මුද්‍රණය කළේ පුවත්පත් පමණකි. ලන්ඩනයේ පළාත්බද බොහෝ සතිපතා පුවත්පත්ද, ලන්ඩන් දුම්රිය පළවල නොමිළයේ බෙදාහරින මෙට්රෝ දිනපතා පුවත්පතද මුද්‍රණය කළේ මෙම ස්ථානයේ ය. දෙසීයකට ආසන්න සේවක සංඛ්‍යාවක් වූ අතර එහි පුවත්පත් වර්ග හැටකට ආසන්න සංඛ්‍යාවක් එළිදැක්විණ. ඉංග්‍රීසි පමණක් නොව දෙමළ, හින්දි, උර්දු, චීන, බෙංගාලි, තුර්කි, පෝලිෂ්, සිප්‍රියට්, ජැපනීස් ආදී විවිධ භාෂාවන්ට අයත් පත්‍ර එහි මුද්‍රණය වූ අතර ලංකා විත්ති සිංහල පුවත්පතද ඉන් එකකි. ගෙවූ මුද්‍රණ ගාස්තු ඉතා ඉහළ වුව ද මුද්‍රණය පියකරු වූයෙන් වසර දහයකට වඩා කාලයක් මම ඔවුන් හා රැඳී සිටියෙමි.

එහෙත් ගිය නොවැම්බර් මස නිව්ස් පැක්ස් ආයතනය හිටිවනම කාටවත් නොකියා වසා දැමීය. ඒ වැසීමේ කිසිම විස්තරයක් කිසිවෙකු නොදනී. හදිසියේ ඔවුන්ගේ බැංකු වෙන් පැමිණ ආයතනයට සීල් තැබූ බව පමණක් කෙනෙක් කීහ. එය විශාල ආර්ථික අර්බුදයකට මුහුණ පාන්නට ඇතැයි මට සිතිණ. දුරකතන ද ක්‍රියාවිරහිතව තිබුණු නිසා හරි තොරතුරක් දැනගන්නට නොහැකි වීය. සේවක පිරිසට කුමක් වීදැයි නොදනිමි. මා දුක් වූයේ බොහෝ කලක් පැවති එම ආයතන ය එසේ නිමාවීම ගැනය. ඒ සමගම ලංකා විත්ති මුද්‍රණය පිළිබඳව ද මා පත් වූයේ ඉතා අසීරු තත්වයකට ය.

ලංකාවිත්ති මුද්‍රණය කරන්නට සුදුසු වෙනත් මුද්‍රණාලයක් ලන්ඩනය පුරා සෙවූව ද එකක්වත් හමුවුණේ නැතැයි කිවහොත් ඔබ පුදුමවෙනවා පමණක් නොව මගේ වචන විශ්වාස නොකරන්නටද පුළුවන. "මොනවා ලන්ඩන් වල ප්‍රින්ටින් ප්‍රෙස් එකක් නෑ.....?" ඔබ අසනවා ඇත.

දන්නා දන්නා අය ගෙන් ඇසීමි. ටෙලිපෝන් පොත් පෙරළා බැලීමි. පරිගණකයේ වෙබ් අඩවි කාල් ගැවෙමි. එහෙත් ඒ කොහෙන් වත් ලන්ඩනයේ මුද්‍රණාලයක් හමු නොවීය. මා පසුව දැනගත්තේ මෙයයි. ලන්ඩනයේ අප දකින පුවත් පත් සියල්ලම පාහේ මුද්‍රණය කරනු ලබන්නේ බොහෝ ඈත ස්කොට් ලන්තය, වේල්සය, ඔක්ස්ෆර්ඩ් හෝ කේම්බ්‍රිජ් වැනි ප්‍රාන්තවල ය. ජනාකීර්ණ නගරවල විශාල කම්හල් හා මුද්‍රණාල පිහිටුවනු නොලබන්නේ පරිසරවේදීන් නිතර උද්ඝෝෂණය කරන ශබ්ද දූෂණයක් එමගින් සිදුවන බැවින් යයි කියති. ඒ කතාවන් කුමක් වුවද මා නම් වැටුණේ ඉතා අසීරු තත්වයකට ය.

ඉහතකී ඈත පළාත්වලට කතා කර මුද්‍රණාල කීපයක්ම සොයාගත් තද එහි මුද්‍රණය කොට පත්තර ටික ලන්ඩනයට ගෙන ඒමට හා බෙදා හැරීමට මට කලින්ට වඩා සෑහෙන වියදමක් සහ කාලයක් දැරීමට සිදුවන්නේය. එය කිසිසේත් හිතකර නොවන තත්වයකි. මා දස අතේ කල්පනා කළේ එයයි. මෙතෙක් අපහසුවෙන් තොරව ඉතා සෞම්‍ය ලෙස සිදුවූ දේවල් දැන් දුෂ්කර කටුක දේ බවට පෙරළී ඇත.

මා මෙතැන් සිට පුවත්පත සම්බන්ධයෙන් කුමක් කළ යුතුද යන්න මා තීරණය කළයුතු වීය.

1997 දී මා ලංකාවිත්ති පටන්ගත්තේ මගේ ම උවමනාවට ය. කිසිවෙකුගේ ආයාචනයකට නොවේ. ඒ වකවානුවේ පුවත්පතක අවශ්‍යතාව මට බෙහෙවින් පෙනිණ. එය අප කාටත් අතිශය කටුක කාලයකි. එය කළ හැකි මෙහි එදා සිටි එකම පුද්ගලයා ද මා විය. එදා මා තුළ වූයේ එකම අරමුණකි. එනම් ලන්ඩන යේ වෙසෙන සිංහළ ජනතාවට හඬක් වන්නට සහ ඒ කටුක යුද්ධය කෙසේ හෝ ජයග්‍රාහීව නිමාවෙනවා දකින්න ටය. ඒ සඳහා මා කැපවිය යුතුයයි මම දැඩිව අදහස් කළෙමි. "මේ තමයි ලංකාවෙන් බැහැර ලෝකයේ පළ වූ ප්‍රථම සිංහළ පත්තරය" යයි කිසිවෙකු ලංකාවිත්තිය දැක කීකල්හි මට අදහා ගත නොහැකි වීය. පසුව සොයා බැලූ විට සත්‍යයත් එය බවද මට පමණක් නොව සමස්ථ ලංකාවටම වැටහිණ.

පත්‍රය වෙනුවෙන් මේ ගතවුණු දහසය වසර මුළුල්ලේ මම බොහෝ දේ කැපකර ඇත්තෙමි. මගේ දිනචරි-යාව, හිතමිතුරන්, සමාජ ආශ්‍රය, උත් සව, සම්භාෂණ, ගමන්බිමන් විනෝද සංචාර, දේශාටනය, විනෝදාංශ මේ ආදී බොහෝ දේ දැඩි ලෙස සීමා කරන්නට මට සිදුවූයේ මේ පුවත් පත නිසා ය. එහෙත් සදාකල් ඒ සීමාවල් තුළ මා ජීවත්විය යුතුමද?

ලංකාවිත්ති පුවත්පතේ මෙතෙක් පැවැත්ම ගැන මට ඉතා සංතෝෂ විය හැක. එය බොහෝ රටවලද, ශ්‍රීලංකා-වේද ලාංකික පාඨකයින් විසින් ඉහළින් අගය කරනු ලැබීම ප්‍රථම කාරණයයි. ඊළඟට, මට කිසිදු අප හසුවක් නැතිව පුවත්පත කරගෙන යෑමට අවශ්‍ය පුවත්, ඡායාරූප, කාටූන්, කතා, කවි, විශේෂාංග ආදී මේ හැම අංගෝපාංගයක්ම නොඅඩුව ඉතා ඉහළ මට්ටමින් ලබන්නට හැකි වීමය. ටෙලිපෝන් පණිවුඩයකින් තත් පර ගණනක් ඇතුළත අවශ්‍ය තොර තුරු හා ඡායාරූප ලන්ඩනයට ලබා ගත හැකිය. පුවත්පත් ලෝකයේ බො-හෝ මිතුරන් සිටීම මා ලද ඒ පිනය.

පුවත්පතක් පවත්වාගෙන යාමට එහි මුද්‍රණයේ සිට බෙදාහැරීම, තැපැල, පාර්සල් මේ ආදී නොයෙක් දේට මුදල් අවශ්‍යය. ඒ සියළු වියදම පියවාගන්නේ ලැබෙන දැන්වීම් වලිනි. ලංකාවිත්තිය විකුණන පුවත්පතක් නොවේ. එය නොමිළේ බෙදාහරින් නකි. එහෙත් මේතාක් අපට මුදල් අහේනියක් නොවීය. අවශ්‍ය ප්‍රමාණය ටත් වඩා දැන්වීම් ලැබිණ. තවත් දැන්වීම් ගතහැකි වුවත් අප එසේ නොකළේ පාඨකයාට කියවීමට අවශ්‍ය ලිපි හා තොරතුරු වැඩියෙන් පළකරනු පිණිස ය.

එසේම තවත් වාසනාවක් අප සතුවූයේ පත්‍රය ලන්ඩනය තුළ බෙදා හැරීමට, විවිධ රටවලට හා ශ්‍රී ලංකා වට යැවීමට ඒ රටවලදී හා ශ්‍රී ලංකාව තුළද අපහසුවක් නැතිව පාඨකයන්ට ලැබෙන්නට සැලැස්වීමට ද ආදී කාර්යයන් සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ හිතවතුන් රාශියක් මේ දහසය වසර මුළුල්ලේම අප හා එක්ව සිටීමයි. ඔවුන් සිය වටිනා කාලය හා ශ්‍රමය මේ පුවත්පත වෙනුවෙන් වැයකළ බව මෙහිදී කෘතඥ පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි.

පත්‍රයක් ගෙනයාමට අවශ්‍ය සියළු දේ නොඅඩුව ඇත්නම් ලංකාවිත්ති නවත් වන්නට හේතුව ඇයි දැයි බොහෝ දෙන අසන්නට හැකිය. හේතුව මා මුලින් කීවා සේ දැන් මේ ඇතිය, ප්‍රමාණවත්ය යන හැඟීම මට ඇතිවූ නිසා ය. එසේම ඕනෑම හොඳ දෙයක් ඉවත්ව යා යුත්තේ කාටත් එපා වූ දාට නොව එය ඉතා ඉහළ තත්ව යක පවතිද්දීය. කීර්තිය හා ප්‍රභාව තවමත් දැල්වෙමින් තිබිය දී ය. තවමත් ඉල්ලුම තිබියදීය. එපා වී කවුරුත් අහක බලාගත් දාට නොවේ. ඒ ධර්මතාව සිත්හි දරමින් ලංකාවිත්ති පත්‍රය මේ කලාපයෙන් අවසන් කරන්නට මම කල්පනා කළෙමි. පටන් ගත්තේ මාය. එසේම අවසන් කළ යුත්තේද මා විසින්ම ය. මේ ඔබ දකින්නේ වසර දහසයක් පුරා මාසිකව ඔබ හමුවන්නට ආ හිතවතෙකුගේ අවසන් ඡායාවයි. අමතක නොවන මුහුණුවරයි.

මා මුලින් සඳහන් කළාක් මෙන් ලංකාවිත්ති පුවත්පත මව්බිමෙන් සැතපුම් හත්දහස් ගණනක් ඈත වෙසෙන සිංහළ පාඨකයින්ට ආලෝකය ගෙන ආ පහනක් විය. ව්‍යසන වලදී හිතහැදූ මිතුරෙකු විය. යුද්ධ සමයේදී ඔවුන් තුළ සුබවාදී බලාපොරොත්තු දැල්ලුවෙහිය. එ නිසාම ඔවුන් අත්හැර යෑම සැබැවින්ම දුකකි. එක් පාඨක ලිපියක ලියා තිබුණේ ඇයගේ මව ලංකාවිත්ති ප්‍රමාද වූ විට ගෙදර ඇති පරණ ලංකාවිත්ති සොයා ගෙන නැවත නැවත ඒවා කියවන බව ය.

මා වඩාත් සිතන්නේ මේ පුවත්පත එනතුරු මාසිකව බලා සිටින පිටරට වෙසෙන ඒ වැඩිහිටි සිංහළ පරම්පරාව ගැනය. එහෙත් මේ සියල්ල ගැන දුක්වීම නිශ්ඵල දෙයකි. දුක්වනු වෙනුවට ලංකා විත්ති කළ මෙහෙය ගැන සිතන්න. ලංකා විත්තිය ඒ සියල්ල කළේ දේශප්‍රේමී ඔබ මෙන්ම පෞද්ගලික ලාභ ප්‍රයෝජන තකා නොව අපේ දෙසට බසට ඇති ස්නේහය නිසාය. ඒ නිසා ලංකාවිත්ති ගැන මට මෙන් පාඨක ඔබට ද සංතෝෂ විය හැක.

මා ගැන සිතතහොත් ඔබට මාසික පත්‍රයක්වූ ලංකාවිත්ති මට සිටි සමීපතම මිතුරාය. මා කළ කී හැමදෙයක්ම නිවැරදි දැයි සෙවූ ගුරුවරයාය. ලෝකයේ මෙතෙක් මා නුදුටු බොහෝ වටිනාදේ පෙන්නා දුන් මාර්ගෝපදේශකයාය. මගේ සිත්සතන් මනාව පිළියෙලකළ යතිවරයාය. මා සිනහ ගැන්වූ ප්‍රීතියෙන් තැබූ මා විනෝදමත් කළ රසවතාය. ඒ සියල්ලටම වඩා මගේ තනි-කම නැසූ මා ගැන සෙවිල්ලෙන් සිටි මගේ රැකවලා ය. හෙට සිට ඔහු නැත.

♦ දයා ආනන්ද රණසිංහ


Duke's Court Travel
DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £548 |
| QATAR AIRWAYS القطرية | Qatar Airways | fr £539 |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £449 |
| Emirates | Emirates (departure from Gatwick) | fr £556 |
| ETIHAD AIRWAYS | Etihad Airways | fr £554 |
| JET AIRWAYS | Jet Airways | fr £501 |
| BRITISH AIRWAYS | British Airways | fr £496 |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

3045 ATOL PROTECTED | AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS | IATA

204 King Street, London W6 0RA



HA HolidayAir A Travel Experience to Remember

The No. 1 Agent to Sri Lanka

Do not book your Air Ticket with any other travel agent until you speak to us!

Best Value Deals to Colombo

| JET AIRWAYS | ETIHAD AIRWAYS | KUWAIT AIRWAYS | SriLankan | QATAR AIRWAYS | OMAN AIR |
|---|---|---|---|---|---|
| £165 +Taxes | £230 +Taxes | £240 +Taxes | £230 +Taxes | £280 +Taxes + 40kg baggage allow | £296 +Taxes |
| Valid till 30th Jun2013 | Valid till 30th Jun2013 | Valid till 30th Jun2013 | Valid till 30th Jun2013 | Valid till 30th Jun2013 | Valid till 30th Jun2013 |

Terms and conditions apply.

0208 440 0770 www.holidayair.com

96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm

Skype us on holiday.air | facebook Holidayair Holidays | ATOL PROTECTED | IATA | MCG